www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 7 – First Term Test – April 2019
පළමු වාර පරීක්ෂණය - 2019 අප්‍රේල් - 7 ශ්‍රේණිය

කාලය : පැය 2
Time :2 hour

## Civic– I
පුරවැසි අධ්‍යාපනය– I

Name :- ................................................... Grade : -................ Index number:-....................

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

❖ අංක 01-05 දක්වා දී ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

- **නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. පවුලක් තුළ දක්නට ලැබෙන පොදු ලක්ෂණයක් නොවන්නේ,
   (1) සාමාජිකයන් අතර ශක්තිමත් බැඳීමක් පැවතීම
   (2) සාමාජිකයන් එකම වාසස්ථානයක වාසය කිරීම
   (3) පවුල සතු සම්පත් තනිවම භුක්ති විඳීම
   (4) සාමාජිකයන්ගේ යහපත අරමුණු කරගෙන එකිනෙකාට බලපෑම් කිරීම

2. පුද්ගලයන් තුළ ආත්මාභිමානයක් ඇති කිරීමට ඉවහල් වන ලක්ෂණ ඇතුළත් පිළිතුර වන්නේ,
   a. ඔබ සතු උසස් ගතිගුණ    b. සුවිශේෂී හැකියාවන්
   c. උසස් හැසිරීම් රටා
   (1) a හා b නිවැරදි ය    (2) a,b හා c නිවැරදි ය
   (3) a හා c නිවැරදි ය    (4) සියළු කරුණු නිවැරදි ය

3. විභාගය හොඳින් සමත් වීමට නම් අප විසින් නොකල යුතු දෙයකි
   (1) දිනපතා පාසල් යාම
   (2) ලකුණු අඩු විෂයයන් සඳහා අඩු අවධානයක් යෙදීම
   (3) හොඳින් අධ්‍යාපන කටයුතු වල නිරත වීම
   (4) කාලසටහනකට අනුව කටයුතු කිරීම

4. කිසියම් පුද්ගලයකු තවත් පුද්ගලයකුගෙන් සුවිශේෂ ලෙස හඳුනා ගැනීම සඳහා යොදා ගත හැකි ලක්ෂණ ඇතුළත් පිළිතුර වන්නේ,
   (a) පුද්ගලයාගේ බාහිර පෙනුම    (b) ඇඟිලි සලකුණු ය
   (c) පුද්ගලයාගේ ඇඳුම    (d) අත්ලේ රේඛා සටහන්
   (1) a හා b නිවැරදි ය    (3) a,b,d තුන නිවැරදි ය
   (2) a, c හා d නිවැරදි ය    (4) සියල්ලම නිවැරදි ය



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

5. කළණ මිතුරකු සතු ලක්ෂණයක් නොවන්නේ,
   (1) යහපත් ගතිගුණ (2) නරක දෙයට යොමු කිරීම
   (3) බුද්ධමත් බව (4) යහපතෙහි පිහිටු වීම

(ල.2x5=10)

- **අංක 06-10 දක්වා දී ඇති ප්‍රකාශන නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද දී ඇති වරහන තුළ යොදන්න.**

6. DNA පරීක්ෂණය තුළින් පුද්ගලයකුගේ සුවිශේෂී බව හඳුනා ගැනීම වඩාත් විද්‍යාත්මක වේ. ( )
7. මත්ද්‍රව්‍ය හා දුම්වැටි මඟින් පුද්ගලයකුගේ ශාරීරික හා මානසික ශක්තිය වර්ධනය කරයි ( )
8. ක්‍රීඩා කටයුතු වල යෙදීමේදී කණ්ඩායම් හැඟීමෙන් යුතුව කටයුතු කිරීම ඉතා වැදගත් වේ. ( )
9. පාරිභෝගිකයෙකුට වෙළෙඳපොළෙන් භාණ්ඩ මිළදී ගැදීමේදී පාරිභෝගික මිල දර්ශනය වැදගත් වේ. ( )
10. සන්සුන් මනසින් යුතුව චිත්‍ර ඇඳීම වැනි සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් වල යෙදීමෙන් චිත්ත වේග පාලනය කරගත හැක. ( )

(ල.2x5=10)

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

11. අප අවට සිටින.............................ඇසුරු කිරීම පුද්ගලයකුගේ පරිහානියට හේතු වේ.
12. පාසල් ශිෂ්‍යයකු ලෙස ඔබට හමුවන අභියෝග ජය ගැනීමට.............................. කටයුතු කළ යුතු ය.
13. පුද්ගලයකු තුළ හටගන්නා.............................අහිතකර චිත්තවේගීය තත්වයකි.
14. ළමා වියෙදීම ඔබ සාමාජිකත්වය ලබන ආයතනය.............................. ය.
15. අප තුළ යහපත් ආකල්ප ඇතිකර ගැනීමට.............................. ඉතා වැදගත් වේ.

(අරමුණකින් තොරව, අධිෂ්ඨානශීලීව, යහපත් මිතුරන්, රැකියා ස්ථානය, නරක මිතුරන්, සතුට, පාසල, ක්ෂණික කෝපය, ආගමික ආයතන, පොලිසිය)

(ල.2x5=10)



agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුරට අදාළ ඉංග්‍රීසි අක්ෂරය ඉදිරයෙන් ඇති කොටුව තුළ යොදන්න.**

| | A | | | B |
|---|---|---|---|---|
| 16 | ගුරුවරුන්ගේ අවවාද අනුශාසනා පිළිගෙන කටයුතු කිරීම | ☐ | A | එදිනෙදා අවශ්‍යතා පහසුවෙන් ඉටුකර ගත හැක |
| 17 | පවුලේ අවශ්‍යතා ඉටුකර ගැනීමට බාහිර පුද්ගලයන්ගේ සහාය ලබා ගැනීමට යොමුවීම | ☐ | B | සමාජයේ පවතින රැකියා හිඟයට පිළියමකි |
| 18 | රැකියාවෙන් ප්‍රමාණවත් ආදායමක් ලැබීම | ☐ | C | පවුලේ සාමාජිකයන් අනාරක්ෂිත වීම |
| 19 | දෙමාපියන් රැකියා සඳහා විදේශගත වීම | ☐ | D | ජීවිත අභියෝග ජය ගැනීමට හැකිවීම |
| 20 | ස්වයං රැකියාවල නිරත වීම | ☐ | E | පවුලේ සාමාජිකයන්ගේ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වීම. |

(ලකුණු 2X5=10)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 7 – First Term Test – April 2019
පළමු වාර පරීක්ෂණය - 2019 අප්‍රේල් - 7 ශ්‍රේණිය

## Civic – II
පුරවැසි අධ්‍යාපනය– II

Name :- ..................................................... Grade : -................ Index number:-....................

**II කොටස**

❖ **ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.**

1. (i) ''චිත්ත වේග'' යනු මොනවා ද? (ල.03)
   (ii) එදිනෙදා ජීවිතයේදී මුහුණ පෑමට සිදුවන චිත්තවේගී තත්ත්වයන් ඇතිවීමට බලපාන සිදුවීම් 4ක් ලියන්න. (ල.04)
   (iii) (a) අයහපත් චිත්තවේගීය තත්ත්වයන් පාලනය කර ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග 3ක් ලියන්න. (ල.03)
   (b) ඉන් එක් ක්‍රියාමාර්ගයක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.02)

2. (i) අභියෝගයක් යනු කුමක් ද? (ල.03)
   (ii) විවිධ අභියෝග ජයගෙන ජීවිතය සාර්ථක කර ගත් පුද්ගලයින් 4 දෙනෙකු නම් කරන්න. (ල.04)
   (iii) (a) ශිෂ්‍යයකු ලෙස ඔබට මුහුණ පෑමට සිදුවන අභියෝග 3ක් ලියන්න. (ල.02)
   (b) ඉන් එක් අභියෝගයක් ජයගත හැකි ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ල.02)

3. (i) ආදේශන භාණ්ඩ යනු මොනවා ද? (ල.03)
   (ii) භාණ්ඩයක් මිළදී ගැනීමේදී පාරිභෝගියකු විසින් සැලකිලිමත් විය යුතු කරුණු 4ක් ලියන්න. (ල.04)
   (iii) (a) විවිධ රසායනික ද්‍රව්‍ය ඇතුළත් ආහාර වර්ග 3ක් ලියන්න. (ල.03)
   (b) එවැනි ආහාර වර්ග අනුභව කිරීමෙන් ඇතිවිය හැකි අහිතකර ප්‍රතිඵල 2ක් ලියන්න. (ල.02)

4. (i) අප අවට සමාජයේ පවතින හිතකර බලවේග යනු මොනවා ද? (ල.03)
   (ii) ඔබගේ ජීවිත සාර්ථකත්වයට බලපාන හිතකර බලවේග 2ක් හා අහිතකර බලවේග 2ක් ලියන්න. (ල.04)
   (iii) ඔබ ඉහතින් සඳහන් කල හිතකර බලවේගයකින් ලැබෙන ප්‍රයෝජන 3ක් හා අහිතකර බලවේගයකින් ජීවිතයට සිදුවිය හැකි හානි 2ක් ලියන්න. (ල.05)



agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

5. (i) ''වැඩ ලෝකය '' යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද? (ල.03)
   (ii) අපට එදිනෙදා අවශ්‍යතා ඉටුකර ගැනීමට අවශ්‍ය වන සේවා 4ක් ලියන්න. (ල.04)
   (iii) රැකියාවක නිරත වී ප්‍රමාණවත් ආදායමක් ලැබීමෙන් ලැබෙන ප්‍රයෝජන 5ක් ලියන්න. (ල.05)

6. (i) මිළ පාලන ප්‍රතිත්තිය යනු කුමක් ද? (ල.03)
   (ii) එදිනෙදා අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා වෙළෙඳපොළෙන් මිළදී ගැනීමට සිදුවන භාණ්ඩ වර්ග 4ක් ලියන්න. (ල.04)
   (iii) (a) පාරිභෝගිකයන්ට වෙළඳපොළ තත්ත්වය හා භාණ්ඩ වල තත්ත්වය පිළිබඳව දැනුවත් වීම සඳහා ඇති මාර්ග 3ක් ලියන්න. (ල.03)
   (b) ඒ පිළිබඳව දැනුවත් වීමෙන් ලැබෙන ප්‍රයෝජන 2ක් ලියන්න. (ල.02)

7. (i) පහත ක්ෂේත්‍ර ආශ්‍රිතව පවතින රැකියා අවස්ථාව බැගින් ලියන්න.
   (a) වී වගාව
   (b) ධීවර කර්මාන්තය
   (c) අධ්‍යාපන සේවාව (ල.3)
   (ii) ලාංකිකයෙකු ලෙස ඔබට නිරත විය හැකි ස්වයං රැකියා 4ක් ලියන්න. (ල.4)
   (iii) (a) ස්වයං රැකියාවක නිරත වීමෙන් ලැබෙන ප්‍රයෝජන 3ක් ලියන්න. (ල.03)
   (b) ඉන් එක් ප්‍රයෝජනයක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.02)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!